**ශීර්ෂය 230 - නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

---

ශීර්ෂය 230 - නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ජූලි 31 දින නීති කෙටුම්පත් සම්පාදක වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම, ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 117.86 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 92.76 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 25.10 ක් හෙවත් සියයට 21.30 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 86.56 | 76.90 | 9.66 | 11.16 |
| මූලධන | 31.30 | 15.86 | 15.44 | 49.33 |
| එකතුව | 117.86 | 92.76 | 25.10 | 21.30 |

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 23001 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 4.00 | 3.87 | 1.50 | 3.02 | 17.00 | 10.65 |

## 2.3 අග්‍රිම ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ වූ අංක 7002/0000/00/0138/0016/000 දරන අග්‍රිම ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට ගිණුම් ශේෂය රු.මිලියන 0.027 ක් විය.

## 2.4 පොදු තැන්පත් ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ වූ අංක 6000/0000/00/0013/0067/000 දරන පොදු තැන්පත් ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට ගිණුම් ශේෂය රු.මිලියන 1.41 ක් විය.

## 2.5 විගණන නිරීක්ෂණය

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසි |
|---|---|---|
| (අ) | ලැබෙන චෙක්පත්, මුදල් ඇණවුම් ආදිය සඳහා වූ ලේඛනය | මුදල් රෙගුලාසි 451 |
| (ආ) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) |

### 3.2 වෙනත් අමාත්‍යාංශ විසින් ලබාදුන් ප්‍රතිපාදන

දෙපාර්තම්න්තුවේ ධාරිතා වර්ධනය කිරීම සඳහා අධිකරණ අමාත්‍යාංශය විසින් ලබාදී තිබුණු රු.30,000,000 ක් වූ ප්‍රතිපාදන උපයෝජනය සඳහා ප්‍රධාන ක්‍රියාකාරකම් 05 ක් යටතේ ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණි. එම ක්‍රියාකාරකම් අතරින් පරිගණකගතකරණය සඳහා සලසා තිබුණු රු.5,000,000 කින් සියයට 69 ක් හෙවත් රු.3,465,530 ක්ද, පරිගණක මිලදී ගැනීම සඳහා සලසා තිබුණු රු.3,000,000 කින් සියයට 51 ක් හෙවත් රු.1,354,490 ක්ද හා නීති පොත් මිලදී ගැනීම සඳහා සලසා තිබූ රු.2,000,000 කින් සියයට 38 ක් හෙවත් රු.776,375 ක්ද වශයෙන් වූ ප්‍රතිපාදන ඉතිරි වී තිබුණු බැවින් අයවැය යෝජනා නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වී තිබුණු බව නිරීක්ෂණය විය.

### 3.3 පොදු තැන්පත් ගිණුම

2015 හා 2016 වර්ෂවලදී එකසත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) යටතේ අධිකරණ අමාත්‍යාංශය විසින් නීති ප්‍රඥාප්ති කෙටුම්පත් කිරීමේ නිලධාරීන්ට ඉංග්‍රීසි පුහුණුව ලබාදීම සඳහා එක්සත් ජාතින්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) යටතේ අධිකරණ අමාත්‍යාංශය විසින් 2015 හා 2016 වර්ෂවලදී ලබාදී තිබුණු රු.1,405,975 ක් අදාළ කාර්යයන් සඳහා වැය නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

### 3.4 දේශීය මූල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

**ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

2014 පෙබරවාරි 28 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව, නීති ප්‍රඥාප්ති ප්‍රතිශෝධන ව්‍යාපෘතිය වෙනුවෙන් 2014, 2015 හා 2016 වර්ෂ සඳහා එකතුව රු.109,175,000 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණද, එම වර්ෂයන්හිදී එකතුව රු.4,702,021 ක් පමණක් උපයෝජනය කර තිබුණි. එය මෙම ව්‍යාපෘතිය සඳහා සලසා තිබුණු මුළු ප්‍රතිපාදනයෙන් සියයට 4.31 ක් විය. තවද, ප්‍රතිශෝධනය කළයුතු වූ නීති ප්‍රඥාප්ති A සිට Z දක්වා කට්ටලවලට වෙන් කර තිබුණු අතර පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉන් A සිට T දක්වා වූ කට්ටලවල නීති ප්‍රඥාප්ති 2016 දෙසැම්බර් 31 දින වන විට ප්‍රතිශෝධනය කර අවසන් කිරීමට සැලසුම් කර තිබුණු නමුත් එම ඉලක්කය කරා ලඟාවීමට නොහැකිවී තිබුණි.

### 3.5 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 37 | 30 | 07 | |
| (ii) | තෘතියික මට්ටම | 28 | 16 | 12 | |
| (iii) | ද්විතියික මට්ටම | 54 | 43 | 11 | |
| (iv) | ප්‍රාථමික මට්ටම | 24 | 22 | 02 | |
| (v) | වෙනත් (කොන්ත්‍රාත් පදනම) | - | 04 | - | 04 |
| | **එකතුව** | **143** | **115** | **32** | **04** |